Lesson 26

# **ඇය එවි**

She will come

අනාගත කාල ක්‍රියා

අපි මේ පාඩමින් ඉගෙන ගන්නේ අනාගත ක්‍රියාවන් ප්‍රකාශ කරන අකාරය ගැන. මෙයත් ඉතාම වැදගත් පාඩමක්, ඒ වගේම ඉතාම ලස්සන වාක්‍යය ඔබට ඉගෙන ගැනීමට ලැබෙන පාඩමක් . අනාගත ක්‍රියාවන් අපිට ඉංග්‍රීසි කතාවේදී නිතර භාවිත කිරීමට සිදුවෙනවා. ඒ වගේම මේ කාලයේ වාක්‍යය හැදෙන ක්‍රමයත් හරි ලේසියි

- අනාගත කාලක්‍රියාවන් ප්‍රකාශ කිරීමේදී අනාගත කාලය හැඟවීම සදහා ආධාරක පදය ලෙස යෙදෙන්නේ will

  Will වලින් තමයි අනාගත කාලය හැඟවෙන්නේ . අපි මිට කලින් am ,is ,are වල අනාගත කාලය ගැන ඉගෙන ගනිද්දීත් will භාවිතා කළා . එහිදී am , is ,are වල අනාගත කාලය විදියට ගැනුනේ will be . නමුත් මෙහිදී අනාගත කාල ක්‍රියාවන් ගැන ප්‍රකාශ කරන්න යෙදෙන්නේ will පමණයි

- Will සමග ක්‍රියා පදයේ සාමාන්‍ය රූපය යෙදෙනවා

  ඒක වචන , බහු වචන කතෘ වරුන් දෙවර්ගය සමගම ඒ විදියට තමයි වාක්‍ය සැදෙන්නේ

  කතෘ + will + ක්‍රියා පදය + කර්මය

අපි උදාහරණ කීපයක් ගනිමු

He will come
හී විල් කම්
ඔහු එවි

Mother will prepare lunch for us
මද(ර්) විල් ප්‍රිපෙයා(ර්) ලන්ච් ෆෝ අස්
අම්මා අපිට දවල් කෑම හදාවි

She will get angry
ෂී විල් ගෙට් ඇංග්‍රි
ඇය කේන්ති ගනීවි

They will finish the work in time
දේ විල් ෆිනිෂ් ද ව(ර්)ක් ඉන් ටයිම්
ඔවුන් වැඩේ වෙලාවට ඉවර කරාවි

Children will make noise
චිල්රන් විල් මේක් නොයිස්
ළමයි සද්ද කරාවි

You will blame me
යූ විල් බ්ලේම් මී
ඔයා මට බනීවි

I will do it
අයි විල් ඩූ ඉට්
මම ඒක කරන්නම්

ඉහත උදාහරණ වල සියලුම ආකාරයේ කතෘ වරුන් ඉන්නවා . නමුත් එකම පිළිවෙලට තමයි වාක්‍යය හැදෙන්නේ
අනාගත කාල ක්‍රියාවන් ප්‍රකාශ වෙන වාක්‍යය , නිකම්ම ඉදිරියේදි වෙන්න තියෙන දෙයක් ගැන කියන්න පමණක් නෙවෙයි , ප්‍රශ්න අහන්න , ඉල්ලීම් කරන්න , කරන්න යන සැලසුමක් ගැන කියන්නත් , පොරොන්දු දෙන්නත් , දැඩි අධිෂ්ඨානය පල කරන්නත් භාවිතා වෙනවා . මෙම පාඩමේ සහ මෙහි නැතාර්ථය සහ ප්‍රශ්නාර්ථය උගන්වන ඊලග පාඩම් දෙකේදී ඒ සියලුම අකාරයේ වාක්‍යය ඔබට හමු වේවි.
අනාගත කාල ක්‍රියාවන්ට අදාළව අපි තවත් උදාහරණ කීපයක් ගනිමු

I will tell you later
අයි විල් ටෙල් යූ ලේට(ර්)
මම ඔයාට පස්සේ කියන්නම්

Teacher will punish us
ටීච(ර්) විල් පනිෂ් අස්
ටීච(ර්) අපිට දඬුවම් කරාවී

He will get late
හී විල් ගෙට් ලේට්
ඔහු පරක්කු වේවි

I will come later
අයි විල් කම් ලේට(ර්)
මම පස්සේ එන්නම්

She  will prepare everything
ෂී විල් ප්‍රිපෙයා  එව්රිතිං
ඇය  හැමදේම පිළියෙළ කරාවි

It will rain today
ඉට්  විල් රේන්  ටුඩේ
අද වහිවී

I will do it later
අයි විල් ඩූ  ඉට්  ලේට(ර්)
මම ඒක  පස්සේ කරන්නම්

We will play sometime after school
වී  විල් ප්ලේ සම්ටයිම් ආෆ්ට(ර්)  ස්කූල්
අපි ස්කෝලේ ඇරිලා ටික වෙලාවක් සෙල්ලම් කරාවි

Tomorrow we will climb that mountain
ටුමාරෝ වී විල් ක්ලයිම් දැට්  මවුන්ටන්
හෙට අපි අර කන්ද නගීවි

That tree will fall anytime
දැට්  ට්‍රී විල් ෆෝල් එනි ටයිම්
අර ගහ කොයි වෙලාවක හරි වැටේවි

You will get ill
යූ  විල් ගෙට්  ඉල්
ඔයාව ලෙඩ වේවි

Situation will become worse
සිටුවේෂන් විල් බිකම් ව(ර්)ස්
තත්වය තවත් නරක අතට හැරේවි

I will go to bed early today
අයි විල් ගෝ ටු බෙඩ් අ(ර්)ලි ටුඩේ
මම අද වේලාසනින් නිදාගන්න යාවි

She will call me later in the evening

ෂී විල් කෝල් මී ලේට(ර්) ඉන් දි ඊව්නිං
ඇය පසුව හැන්දෑ වෙලා මට කෝල් කරාවි

He will pass the exam this time
හී විල් පාස් දි එග්සෑම් දිස් ටයිම්
මේ පාර ඔහු විභාගේ පාස් වේවි

My father will buy me a smart phone
මයි ෆාද(ර්) විල් බයි මී අ ස්මාට් ෆෝන්
මගේ තාත්තා මට ස්මාට් ෆෝන් එකක් අරන් දේවි

We will win the game
වී විල් වින් ද ගේම්
අපි තරගය දිනාවි

It will take a long time to finish
ඉට් විල් ටේක් අ ලෝං ටයිම් ටු ෆිනිෂ්
ඉවර කරන්න ගොඩාක් වෙලා යාවි

They will get late
දේ විල් ගෙට් ලේට්
ඔවුන් ප්‍රමාද වේවි

Teacher will blame us
ටිච(ර්) විල් බ්ලේම් අස්
ටීචර් අපට බනීවි

She will get angry
ෂී විල් ගෙට් ඇංග්‍රි
ඇයට කේන්ති යාවි

My mother will not give her permission
මයි මද(ර්) විල් නොට් ගිව් හ(ර්) පර්)මිෂන්
මගේ අම්මා ඇගේ අවසරය නොදේවි

It will happen again
ඉට් විල් හැපන් අගේන්
එය නැවත සිදුවේවි

They will not support us
දේ විල් නොට් සපෝට් අස්
ඔවුන් අපට සහයෝගය නොදේවි

You  will get  ill
යූ විල් ගෙට් ඉල්
ඔයාව ලෙඩ වේවි

හොදයි , දැන් උත්සාහ කරන්න අනාගත කාලයේ සිදුවෙන්න නියමිත ක්‍රියාවන් සදහා ඔබේම වාක්‍යය කිහිපයක් සාදන්න පුලුවන්ද කියලා. ඔබට දැනට ඇති දැනුමින් , ඔබ දැනට දන්නා වචන භාවිත කරලා  එවැනි වාක්‍යය ඕනා තරම් සෑදිය හැකියි. ඒ සදහා උත්සාහ කරන්න

Lesson  26

**Spoken English**

වෙලාව අසන්න සහ කියන්න අපි මූලිකව ඉගෙන ගත්තානේ පසුගිය Spoken English පාඩමේ . අපිට ඒ ගැන තවත් දේවල් ඉගෙන ගන්න පුළුවන් මේ කෙටි සංවාද කිහිපය දෙස බැලුවොත්

Dialogue 1

A: What’s the time now?
වට්ස් ද ටයිම් නව් ?
දැන් වෙලාව කීයද?

B: It’s quarter past 4.
ඉට්ස් ක්වාට(ර්)  පාස්ට් ෆෝ
හතරයි කාලයි

Dialogue2

A: What time is it?
වට් ටයිම් ඉසිට් ?
වෙලාව කීයද?

B: It’s quarter to 8.
ඉට්ස් ක්වාට(ර්)  ටු එයිට්
අටට කාලයි

Dialogue 3

A: Can you please tell me the time?
කැන් යූ ප්ලීස් ටෙල් මී ද ටයිම් ?
කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: It’s 6:45.
ඉට්ස් සික්ස් ෆෝ(ර්)ටි ෆයිව්
හයට විසිපහයි

Dialogue 4

A: What’s the time, please?
වට්ස් ද ටයිම්, ප්ලීස්?
කරුණාකර වෙලාව කීයද?

B: It’s 10 o’clock.
ඉට්ස් ටෙන් ඔක්ලොක්
දහයයි

Dialogue 5

A: What time is it now?
වට් ටයිම් ඉසිට් නව්?
දැන් වෙලාව කීයද?

B: It’s 11:15.
ඉට්ස් ඉලෙවන් ෆිෆ්ටීන්
එකොළහයි පහළොවයි

Dialogue 6

A: Excuse me, what time is it?
එක්ස්කියූස් මී, වට් ටයිම් ඉසිට්?
සමාවෙන්න , වෙලාව කීයද? (මෙතන Excuse me කියලා කියන්නේ තමන් කරන විමසීම වෙත අවධානය යොමු කරවා ගැනීමට )

B: It’s 2:30.
ඉට්ස් ටූ ත(ර්)ටි
දෙකයි තිහයි

Dialogue 7

A: Tell me the time, please.
ටෙල් මී ද ටයිම්, ප්ලීස්.
කරුණාකර මට වෙලාව කියන්න

B: It’s half past 2.
ඉට්ස් හාෆ් පාස්ට් ටූ
දෙක හමාරයි

Dialogue 8

A: What’s the time right now?
වට්ස් ද ටයිම් රයිට් නව්?
දැන්  වෙලාව කීයද?

B: It’s 1 o’clock.
ඉට්ස් වන් ඔක්ලොක්
එකයි

Dialogue 9

A: Can you tell me the time, please?
කැන්  යූ ටෙල් මී ද ටයිම්, ප්ලීස්?
කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: It’s five minutes to 7
ඉට්ස් ෆයිව් මිණිට්ස් ටු  සෙවන්
හතට පහක් විතර ඉතිරියි

Dialogue 10

A: What’s the current time?
වට්ස් ද කරන්ට් ටයිම්?
දැන් වෙලාව කීයද?

B: It’s 9:10.
ඉට්ස් නයින් ටෙන්
නමයයි දහයයි

Dialogue 11

A: Can you tell me the exact time?
කැන් යූ ටෙල් මී ද එක්සැක්ට් ටයිම්?
ඔයාට පුලුවන්ද හරියටම වෙලාව කීයද පුළුවන්ද?

B: It’s 12:50.
ඉට්ස් ට්වෙල්ව් ෆිෆ්ටි
දොළහයි පනහයි

හොදයි අපි ඊලග පාඩමේදී තවත් දේවල් ඉගෙන ගනිමු මේ සම්බන්ධව . එතෙක් මේ තාක් උගත් දේවල් හොදින් මතක තබා ගන්න

**Vocabulary 26**

quarter – ක්වාට(ර්) – කාල
half – හාෆ් – බාගෙ
climb – ක්ලයිම් – ඉහලට නගිනවා
exactly – එග්සැට්ලි – හරියටම

good – ගුඩ් – හොද
better – බෙට(ර්) – වඩා හොද
best – බෙස්ට් – හොදම
silence – සයිලන්ස් – නිහඬතාවය

bad – බෑඩ් – නරක
worse – ව(ර්)ස් – වඩානරක
worst – ව(ර්)ස්ට් – නරකම
stain – ස්ටේන් – පැල්ලම

thicket – තිකිට් – වන ලැහැබ

week – වීක් – සතිය

weak – වීක් – දූර්වල

foot path – ෆුට් පාත් – අඩි පාර

oven – අවන් – උදුන

stove – ස්ටෝව් – ලිප

blender – බ්ලෙන්ඩර් – / මිශ්‍රණ යන්ත්‍රය

toaster – ටෝස්ට(ර්) – පාන් ටෝස්ට් කරන උපකරණය

washing machine – වොෂින් මැෂින් – රෙදි සෝදන යන්ත්‍රය

iron – අයන් – ඇඳුම් මදින උපකරණය

air conditioner – එයා(ර්) කන්ඩිෂන(ර්) – වායු සමීකරණ යන්ත්‍රය

fan – ෆෑන් – විදුලි පංකා

water heater – වෝටර් හීට(ර්) – ජලය උණුකරන උපකරණය

rice cooker – රයිස් කුක(ර්) – බත් රඳවන යන්ත්‍රය

electric kettle – ඉලෙක්ට්‍රික් කෙට්ල් – විදුලි කේතලය

saw – සෝ – කියත

chisel – චිස්ල් – නියන

drill – ඩ්‍රිල් – විදින උපකරණය

sandpaper – සෑන්ඩ්පේප(ර්) – වැලි කඩදාසිය

toolbox – ටූල්බොක්ස් – උපකරණ පෙට්ටිය

hammer – හැම(ර්) – මිටිය